ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

මාධ්‍ය නිවේදනය

ඉන්දියාවේ සහ ශ්‍රී ලංකාවේ මන්දිරවය පාලන ආයතන අතර 5 වන අධ්‍යක්ෂ ජනෙරාල් මට්ටමේ සාකච්ඡා කොළඹ දී පැවැත්වේ

ඉන්දියාවේ සහ ශ්‍රී ලංකාවේ මන්දිරවය පාලන ආයතන අතර 5 වන අධ්‍යක්ෂ ජනෙරාල් මට්ටමේ සාකච්ඡා 2026 සැප්තැම්බර් 23 වන දින කොළඹ දී පැවැත්විණ.

2. මහිදී ඉන්දීය අග්‍රාමාත්‍ය ශ්‍රී නරේන්ද්‍ර මෝදි මැතිතුමාගේ 2025 අප්‍රේල් ශ්‍රී ලංකා නිල සංචාරය අතරතුර විශේෂයෙන්ම නීති විරෝධී මන්දිරවය ජාවාරම මැඩපැවැත්වීම සම්බන්ධයෙන් ඇති කරගත් ද්විපාර්ශ්වික ආරක්ෂක සහයෝගීතාවය යලින් අවධාරණය කරමින් දපොර්ශවය අතර සාකච්ඡා පවත්වන ලදී. තව ද 2026 සැප්තැම්බර් 9 වන දින කොළඹ දී ඉන්දීය ආරක්ෂක අමාත්‍ය ශ්‍රී රාජනාත් සිං මැතිතුමා සමඟ පැවති හමුවේදී, ශ්‍රී ලංකා ජනාධිපති අතිගරු අනුර කුමාර දිසානායක මැතිතුමා ඉන්දීය සාගර කලාපයේ නීති විරෝධී මන්දිරවය ජාවාරම සඳහා ඉන්දියාවේ පූර්ණ සහයෝගය ඉල්ලා සිටියේය.

3. මන්දිරවය පාලන කාර්යාංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනෙරාල් ආර්. සුධාකාර් මහතාගේ ප්‍රධානත්වයෙන් ඉන්දීය දූත පිරිස 5 වන අධ්‍යක්ෂ ජනෙරාල් මට්ටමේ සාකච්ඡා සඳහා සහභාගී වූ අතර ශ්‍රී ලංකා දූත පිරිසේ ප්‍රධානත්වය දරන ලද්දේ ශ්‍රී ලංකා පොලිස් මන්දිරවය නාශක කාර්යාංශයේ නියෝජ්‍ය පොලිස්පති කේ. ඩී. පී. එල්. අශෝක ධර්මසේන මහතා විසිනි. මන්දිරවය පාලන කාර්යාංශයේ නිලධාරීන්ට අමතරව ඉන්දීය දූත පිරිසට තමිළනාඩු පොලිසිය, ඉන්දීය වරෙළාරක්ෂක බලකාය සහ විදේශ කටයුතු අමාත්‍යාංශයේ නිලධාරීන් ඇතුළත් වූ අතර ශ්‍රී ලංකා දූත පිරිසට පොලිස් මන්දිරවය කාර්යාංශයේ නිලධාරීන්ට අමතරව නීතිපති දපොර්තමේන්තුව, ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා වරෙළාරක්ෂක බලකාය, රජයේ රස පරීක්ෂක දපොර්තමේන්තුව, විශේෂ කාර්ය බලාකාය, NDDCB සහ මූල්‍ය බුද්ධි ඒකකය යන ආයතනවල නිලධාරීන් ඇතුළත් විය.

4. මමෙ සාකච්ඡාවන්හිදී දපොර්ශවය විසින් විශේෂයෙන්ම සමුද්‍රීය මාර්ග ඇතුළු ක්‍රම හරහා මන්දිරවය ජාවාරම් සිදු කිරීමේ ප්‍රවණතා, සංවිධානාත්මක අපරාධකරුවන් සොයාගැනීම, බුද්ධි තොරතුරු සම්බන්ධයෙන් සහයෝගයෙන් කටයුතු කිරීම සහ

සංවිධානාත්මක අපරාධ විමර්ශනය යනාදිය සම්බන්ධයෙන් සමාලෝචනය කරන ලදී. මන්දරවය ජාවාරම් කටයුතු සම්බන්ධයෙන් ක්‍රියාවට නැංවිය හැකි බුද්ධි තොරතුරු, මාර්ග සහ යාන්ත්‍රණ යනාදිය ද දපොර්ශවය අතර බෙදා ගන්නා ලදී.

5. නීතිවිරෝධී මන්දරවය ජාවාරම විසින් මතු කරන විවිධ අභියෝග ඵලදායී අයුරින් ජයගැනීම සඳහා දරෙට අතර ආයතනික සහයෝගිතාවය සහ නීතිය ක්‍රියාත්මක කරන ආයතන අතර සම්බන්ධීකරණය ශක්තිමත් කිරීමට මහේදී දපොර්ශවය එකඟ විය.

***

කොළඹ
2026 සැප්තැම්බර් ***23***